ඒෂියන් ග්‍රැමර් පාසල

පළමුවාර පරීක්ෂණය - 2017

9 ශ්‍රේණිය

නර්තනය

නම :- ..........................................................

කාලය පැය 021/2 යි.

සැකසුම :- රුක්මන් අබේසිංහ

පන්තිය ........................

I කොටස

❖ නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. කුවේණිය ශාප කරන ලද්දේ,

(1) පඬුවස්දෙව් රජුට  (2) විජය රජුට ය.

(3) විජය වික්‍රම රජුට ය.  (4) මලය රජුටය.

02. ඊශ්වර දෙවි මලය රජු කැඳවාගෙන ඒමට භාර දුන්නේ,

(1) රාහු අසුරේන්ද්‍රයාට  (2) පඬුවස් දෙව් රජුට

(3) ඊශ්වරයාට  (4) මහා සුරේන්ද්‍රයාට

03. පඬුවස් දෙව් රජතුමා සුවපත් වූයේ,

(1) කොහොඹා කංකාරි ශාන්තිකර්මයෙන් පසුවය.

(2) දෙවෙල්මඩු ශාන්තිකර්මයෙන් පසුවය.

(3) පහන්මඩු ශාන්තිකර්මයෙන් පසුවය.

(4) බලි ශාන්තිකර්මයෙන් පසුවය.

04. කොහොඹා කංකාරි ශාන්තිකර්මය පවත්වනු ලබන්නේ,

(1) ලෙඩරෝගවලින් මිදීමට ය.  (2) දෙවියන්ට පිං දීමටය.

(3) අධ්‍යාපන කටයුතු සාර්ථක වීමටය.  (4) නවග්‍රහයින් උදෙසාය.

05. උඩරට හා සබරගමු සම්ප්‍රදායන්ට අයත් ශාන්තිකර්ම වේ.

(1) කොහොඹාකංකාරිය හා කිරිමඩුව

(2) කොහොඹා කංකාරිට හා සහ අට සන්නිය

(3) කිරිමඩුව හා හැල්ලුම් මඩුව

(4) කිරිමඩුව හා දෙවොල් මඩුව

06. වෙස් නැටුම් වලට ප්‍රමුඛස්ථානයක් දී ඇති පෙරහැරකි.

(1) වේල් පෙරහැර (2) දළඳා පෙරහැර

(3) සමන්දේවාල පෙරහැර (4) කතරගම පෙරහැර

07. දෙවොල් බෙරය හා හොරණෑව අයත් වන්නේ,

(1) ආතත හා සුසිර කොටසටය.

(2) විතතාතත හා සුසිර කොටසටය.

(3) ආතත හා ඝණ කොටසටය.

(4) විතත හා ඝණ කොටසටය.

08. "යක් ඇනුම හෙවත් යක් ඇන්නුම" නර්තනාංගය අයත් වන්නේ,

(1) පහන් මඩුවට ය. (2) දොවොල් මඩුවට ය.

(3) කොහොඹාකංකාරියට ය. (4) බලි ශාන්තිකර්මයට ය.

09. මෙයින් යාග ගීතයක පද කොටසක් වන්නේ,

(1) එක පළුරෙන් ලී සයක් කපා ගෙන (2) අහසට පිඹිනා චිරන් කළේයා

(3) හිස මුව තුල බෙල්ල දෙවුර (4) අතකය ගෙන රබන් පොඩිය

10. අම්බලන්ගොඩ, ගාල්ල යන ප්‍රදේශවල බහුලව පවතින්නේ,

(1) පහතරට නර්තන සම්ප්‍රදාය (2) උඩරට නර්තන සම්ප්‍රදාය

(3) සබරගමු නර්තන සම්ප්‍රදාය (4) ද්‍රවිඩ නර්තන සම්ප්‍රදාය

11. මාත්‍රා 3 + 4 දෙතිතට අයත් වන්නමකි.

(1) නෛඅඩි වන්නම (2) මයුරා වන්නම

(3) සිංහරාජ වන්නම (4) වෛරොඩි වන්නම

12. උඩරට සම්ප්‍රදායේ නමවන ගොඩ සරඹය හඳුන්වන නාමය වන්නේ,

(1) දෑත පෑගීමේ සරඹය (2) අංගහාරය සරඹය

(3) අර්ධ චක්‍ර සරඹය (4) චන්ද්‍රිකා සරඹය

13. දෙවියන් ප්‍රමුඛත්වයේ ලා සැලකෙන ශාන්තිකර්ම වේ.

(1) කොහොඹාකංකාරිය, සන්නියකුම, මහසොහොන් සමයට

(2) කොහොඹාකංකාරිය, පහන්මඩුව, දෙවොල් මඩුව

(3) කොහොඹාකංකාරිය, පහන්මඩුව, රටයකුම

(4) කොහොඹාකංකාරිය, කිරිමඩුව, සන්නියකුම

14. වරපටි ලෙස සම් උපයෝගි නොගන්නා බෙර වර්ගයකි.

(1) ගැටබෙරය (2) දවුල් බෙරය

(3) දෙවොල් බෙරය (4) දඬු බෙරය

15. සාමාන්‍ය මිනිසුන්ගේ වෘත්තීන් පදනම් කරගෙන ගයන ගීත මේ නමින් හැඳින් වේ.

(1) ප්‍රශස්ති (2) යාග ගී

(3) ගැමි ගී (4) සෝ ගී

16. 6, 7, 8 ගොඩ සරඹ මේ නමින් හැඳින් වේ.

(1) අඩිය, දෑඩිය, තුන් අඩිය සරඹයන්ය.

(2) දෑල. අංගහාර, අර්ධචක්‍ර, සරඹයන්ය.

(3) ඇල, දෑල, අංගහාර සරඹයන් ය.

(4) අංගහාර, අර්ධචක්‍ර, දෙපැති සරඹයන්ය.

17. මාත්‍රා තුනේ තනි තිතට අයත් බෙර පදයකි.

(1) ජිං ගත ගොගො (2) දොම් කිත කිත දොම්

(3) කුඳ ගත ගත දොම් (4) දොං ජිංත ගත දොංත

18. රංග වස්ත්‍රාභරණ හා වේදිකා සැරසිලි මඟින් අදහස් ප්‍රකාශ කිරීම.

(1) වාචික අභිනයයි. (2) සාත්වික අභිනයයි.

(3) ආංගික අභිනයයි. (4) ආහාර්ය අභිනයයි.

19. උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රවීන නර්තන ශිල්පියෙකි.

(1) කේ.එස්. ප්‍රනාන්දු ගුරුතුමා (2) එස්. පනීභාරත ගුරුතුමා

(3) ජී.වී. හීන්නිලමේ ගුරුතුමා (4) සච්සිරි සිල්වා ගුරුතුමා

20. කොහොඹා කංකාරියේ දීර්ඝවුත් අලංකාරවුත් නර්තන අංගය වේ.

(1) අස්නේ (2) ආවැන්දුම

(3) බුලත් පදය (4) යක් ඇනුම

**(ලකුණු 20)**

❖ හිස්තැනට සුදුසු පිළිතුර ලියන්න.

21. පළමු ගොඩ සරඹේ කස්තිරම ...........................................................................

22. විතත භාණ්ඩ දෙකක් නම් කරන්න.

1. ........................................................ 2. ..............................................

23. පහතරට බෙරයට යොදන නම් දෙකක් ලියන්න.

1. ........................................................ 2. ..............................................

24. අවකාශ භාවිතය ප්‍රධාන කොටස්................................................. කි.

25. ගැට බෙරය සඳහා භාවිත දැව වර්ගයකි. ..............................................................

26. තෙල්මේ ඇඳුම් කට්ටලය දක්නට ලැබෙන්නේ ............................................ සම්ප්‍රදායේ ය.

27. ග්‍රහ පන්ති කවි ගායනා කරන්නේ ..................................... ශාන්තිකර්මයේ ය.

28. හාස්‍ය දක්වන ගැමි නාටකයකි. ..................................................................

29. නර්තනයට අධිපති දෙවියන් ලෙස සලකන්නේ ...........................................................

30. .......................................... බුදුන්. දෙවියන්, රජුන් මුල් කරගෙන රචනා වී ඇති ගායනා විශේෂයකි.

(ලකුණු 20)

## II කොටස

❖ ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපන්න.

01. (i) දේශිය නර්තන සම්ප්‍රදායන්වල ප්‍රධාන ශාන්ති කර්ම නම් කරන්න.

(ii) ශාන්තිකර්ම පැවැත්වීමේ අරමුණු තුනක් සඳහන් කරන්න.

(iii) එක් ශාන්තිකර්මයක පුරාවෘත කතාව ලියන්න.

(ලකුණු 11)

02. (i) දේශිය ශාන්තිකර්මයක් තෝරාගෙන එහි එන චාරිත්‍ර විධි 3 ක් කෙටියෙන් විස්තර කරන්න.

(ii) එම ශාන්තිකර්මයේ දක්නට ලැබෙන නර්තන අංග 3 ක් හා නාට්‍යමය අවස්ථා 2ක් පිළිබඳව විස්තර කරන්න.

(ලකුණු 11)

03. (i) මාත්‍රා 3 + 4 දෙතතිට අයත් බෙරපදයක් ප්‍රස්තාර කරන්න.

(ii) මාත්‍ර 3 තනි තිතට අයත් කවියක් ප්‍රස්තාර කරන්න.

(iii) මාත්‍රා 3 + 4 දෙතිතට අයත් වන්නමක කවියක් ප්‍රස්ථාර කරන්න.

(ලකුණු 11)

04. (i) සතර අභිනය නම් කරන්න.

(ii) එක් එක් අභිනයන් පිළිබඳව වෙන වෙනම පැහැදිලි කරන්න. (ලකුණු 11)

05. (i) උඩරට, පහතරට, සබරගමු නර්තන සම්ප්‍රදායන්ට අයත් නර්තන ශිල්පීන් තිදෙනෙක් නම් කරන්න.

(ii) ඉන් එක් නර්තන ශිල්පියෙක් පිළිබඳ විස්තර කරන්න.

(ලකුණු 11)

06. (i) ද්‍රවිඩ ගැමි නැටුම් තුනක් නම් කරන්න.

(ii) එම ද්‍රවිඩ ගැමි නැටුම් තුන පිළිබඳව වෙන වෙනම විස්තර කරන්න.

(ලකුණු 11)

07. (i) පහත දැක්වෙන වචන 3 ක් පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න.

| | | |
|---|---|---|
| 1. අවකාශ භාවිතය | 3. දේශීය වාද්‍ය භාණ්ඩ | 5. සම්ප්‍රදායික ගායනා |
| 2. ගොඩ සරඹ | 4. ගැමි නැටුම් | 6. තාලම් කවි |

(ලකුණු 11)